- **අභ්‍යන්තර අයදුම්කරුවන් (රාජකීය විද්‍යාලයීය සිසුන්)**

  පාසලේ දැනට අධ්‍යාපනය ලබන සිසුන් පහත සබැඳිය භාවිතා කර අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

  **අභ්‍යන්තර අයදුම්පත් සබැඳිය:**

  **Royalist Applicant**

- **බාහිර අයදුම්කරුවන්**

  වෙනත් පාසල්වලින් උසස් පෙළ අධ්‍යාපනය සඳහා ඇතුළත් වීමට අපේක්ෂා කරන සිසුන් පහත සබැඳිය භාවිතා කර අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

  **බාහිර අයදුම්පත් සබැඳිය:**

  **Non Royalist Applicant**

**වැදගත් කරුණු**

1. සියලු තොරතුරු නිවැරදිව හා සම්පූර්ණව ඇතුළත් කළ යුතුය.
2. "ඉංග්‍රීසියෙන්" ලෙස දක්වා ඇති ප්‍රශ්න සඳහා පමණක් ඉංග්‍රීසි භාවිත කල යුතු අතර අනෙක් සියලු ප්‍රශ්න සඳහා සිංහලෙන් පිළිතුරු සපයන්න.
3. අසත්‍ය තොරතුරු ලබා දීමෙන් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.
4. ඉගෙනීමට අදහස් කරන විෂයයන් තෝරා ගැනීමේදී පාසල තුල ක්‍රියාත්මක පහත විෂය සංයෝජන කෙරෙහි අවධානය යොමු කරන්න.කලා අංශයේ එක් විෂය කාණ්ඩයකින් එක් විෂයක් බැගින් තෝරාගන්න.

**පාසල පිරිනමනු ලබන විෂය සංයෝජන**

**ජීව විද්‍යා අංශය**

- ජීව විද්‍යාව
- රසායන විද්‍යාව
- භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව

**ගණිත අංශය**

- සංයුක්ත ගණිතය
- භෞතික විද්‍යාව
- රසායන විද්‍යාව/තොරතුරු සන්නිවේදන තාක්ෂණය

**වාණිජ අංශය**

- ගිණුම්කරණය
- ආර්ථික විද්‍යාව
- ව්‍යාපාර අධ්‍යයනය/ තොරතුරු සන්නිවේදන තාක්ෂණය

**කලා අංශය**

**කාණ්ඩ 1**

• සිංහල
• ජපන් භාෂාව
• තොරතුරු සන්නිවේදන තාක්ෂණය

**කාණ්ඩ 2**

• සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
• භූගෝල විද්‍යාව
• දේශපාලන විද්‍යාව
• ඉන්දියන් ඉතිහාසය
• චීන භාෂාව
තර්ක ශාස්ත්‍රය

**කාණ්ඩ 3**

• තර්ක ශාස්ත්‍රය
• ආරථික විද්‍යාව
• කෘෂි විද්‍යාව
• යුරෝපා ඉතිහාසය
• ගෘහ ආරථික විද්‍යාව
• චිත්‍ර/නැටුම්/පෙරදිග සංගීතය /නාට්‍ය හා රංග කලාව
• බෞද්ධ ශිෂ්ටාචාරය
• දේශපාලන විද්‍යාව

5. අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු ලැබෙන අයදුම්පත්‍ර අංකය අනාගත විමසීම් සඳහා සුරක්ෂිතව තබා ගන්න.
6. වත්මන් රාජකීයයකු නම් මාර්ගගතව අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු ඔබ ඇතුලත් කල විද්‍යුත් තැපැල් ලිපිනයට සම්පූර්ණ කල අයදුම්පත්‍රයේ බාගත කල හැකි ගොනුවක් ස්වයංක්‍රීයව යොමුවේ.එය බාගත කර එහි මුද්‍රිත පිටපතක් ලබාගෙන අදාල තැන්හි අත්සන් යොදා “විදුහල්පති ,රාජකීය විද්‍යාලය, හොරණ” යන ලිපිනයට **2026.06.23** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාර දෙන්න
7. බාහිර අයදුම්කරුවකු නම් මාර්ගගතව අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු ඔබ ඇතුලත් කල විද්‍යුත් තැපැල් ලිපිනයට සම්පූර්ණ කල අයදුම්පත්‍රයේ බාගත කල හැකි ගොනුවක් ස්වයංක්‍රීයව යොමුවේ.එය බාගත කර එහි මුද්‍රිත පිටපතක් ලබාගෙන අදාල තැන්හි අත්සන් යොදා “විදුහල්පති ,රාජකීය විද්‍යාලය, හොරණ” යන ලිපිනයට **2026.06.25** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාර දෙන්න
8. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන **බාහිර අයදුම්කරුවන්ට දැනුම් දෙනු ලැබේ**.
9. ඇතුළත් කිරීම පාසල් ප්‍රතිපත්ති හා අදාළ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව සිදු කෙරේ.
10. සම්පූර්ණ කළ අයදුම්පතෙහි පිටපතක් යම් තාක්ෂණික හේතූන් මත විද්‍යුත් තැපෑලට නොලැබුණේ නම් බාහිර අයදුම්කරුවන් සඳහා වන අයදුම්පතක් සම්පූර්ණ කර සම්මුඛ පරීක්ෂණ සඳහා රැගෙන එන්න